# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 12
NUMBER 01

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

APRIL 10, 2009 අප්‍රියෙල් මාසය (බුද්ධ වර්ෂ 2552 බක් මාසය)


## පාඨක ඔබ සැමට සුබ සිංහළ අළුත් අවුරුද්දක් වේවා!



*Photograph* - Chathura S. Kodikara චතුර එස්. කොඩිකාර - Rivira Media - Sri Lanka

# අවසන් කොටි නැටුම

♦ සංජය විමලරත්න විසිනි

කොටි නායකයා ඇතුළු ඉතිරිව සිටින කොටි හමුදාවේ සුළු පිරිස අප වීරෝදාර සන්නද්ධ හමුදා විසින් වර්ග කිලෝමීටර යක භූමි ප්‍රමාණයකට කොටුකර දැන් අවසාන ප්‍රහාරය යොමු කරන මේ අවස්ථාවේ විවිධ රටවල සිටින කොටි ඩයස්පෝරා-වේ ද්‍රවිඩ පිරිස් හොඳ හොඳ කොටි නැටුම්වල යෙදී සිටින අයුරු ලෝක-යාට දැකගත හැකිය. ක්‍රම යෙන් එහේ කොටිරැළ අප හමුදාවලට කොටුවෙත්ම මෙහේ මුන්ගේ ඊළාම් සිහිනයද අද බිමටම කඩා වැටීඇත. ඒ වැටෙන ප්‍රමා ණයට අනුපාතික මුන්ගේ "තදවීමද" වැඩිවෙයි. එම ඊළාම් රාජ්‍යය තවමත් තරයේ විශ්වාස කරන වයොවෘද්ධ මට්ටමේ සිට කොටි පැටව් දක්වා ද, කොටි ධෙනුවන් ද දැන් කරන මේ අවසාන කොටි නැටුම ගැන පහදාදීම මෙම ලිපියේ අරමුණයි.



### එදා පෙරහැරේ කොටි නැටුම

එකල සිටම අප රටේ පැවැත්වෙන පෙරහැර නැටුම්, ගැයුම්, කෙළිසෙල්ලම් ආදියෙන් පිරී තිබුණි. මේ පෙරහැර අවසන් වූයේ එහි අවසන් ජවනිකාව වූ කොටි නැටුමකිනි. එකලද අද මෙන්ම කොටියා ගම්වැසියන්ට ව්‍යසනයක් වීය. ඒ ඌ ඇවිත් හරක් මරාකන්නට බලන බැවිනි. ගමරාළ කොටියා මෙල්ල කරන ආකාරය රඟදැක්වීම තුළින් කොටි නැටුම පෙරහැර නරඹන අය විනෝදයට පත් කළේය. අමුඩ කෙටියක් ගසා, මුළු ශරීරයේම කහපාට තවරාගෙන, කළු පුල්ලි ඒ මත ලකුණු කරගෙන, මුහුණේ කොටි රැවුල්ගස් කීපයක් ඇඳගෙන, කම්මුල් පිම්බී හකුපාඩා ඉල්පෙන්නට දොඹ ගෙඩියක් කටේ දමාගෙන, වලිගයක්ද පිටිපසින් බැඳගත් ගැමියෙක් කොටි යාට ඇඳ එක පැත්තක සිටී. තවත් උස මහත ගැමියෙක් අමුඩයක් ගසාගෙන, දිග පොල්ලක්ද ගෙන අනෙක් පැත්තේ සිටී. ඒ ගමරාළය. ඔහු පොල්ල හරස් කරත්ම කොටියා ඊට උඩින් පනින්නට හදයි. ගමරාළ ඌට පහර දෙයි. නැවත කොටියා පොල්ලට යටින් රිංගන්නට මානබලයි. එයද වළකන ගමයා යළිත් කොටියාට පහර දී පන්නයි. මෙලෙස නොයෙක් ආකාරයෙන් රිංගන්නට යන කොටියා එය බලමින් විනෝදවන ප්‍රේක්ෂකයින්ගේ ඇඟටද පනී. එවිට ගමයා කොටියාට තඩිබාන්නට පටන් ගනී. පහරකාගෙන කොටියා මිනිසුන් ගේ සිනා සෝෂා මැද නේන්නටම දුවයි. මෙසේ කොටි නැටුම අතී තයේ ගමේ පෙරහැරට විනෝදය එක් කළේය. මේ සඳහා පුරුදු කළ නළුවන්ද එකල ගම්වල සිටියෝය.

### වර්තමාන කොටි නැටුම්

මේ කොටි නටන්නේ එවැනි අහිංසක කොටි නැටුමක් නොවේ. දශක කීපයක් කොටින් ගේ ගජබින්න ප්‍රචාරයන් මත ඊළාම් සිහින මවාගත් යුරෝ පයේ, ඇමරිකාවේ, කැනඩාවේ සහ ඕස්ට්‍රේලියාවේ කොටි ඩයස්පෝරාව එම සිහිනය ඇස් පනාපිටම ගරාවැටෙත්ම ශ්‍රී ලංකාව සහ එහි ජනතාව සමග තද වෛරයෙන් වෙළී කරන විෂම නැටුමකි. මෙම කොටි ඩයස්පෝරාව වූකලී සියළු තක්කඩිකම්වල යෙදෙමින් ද්‍රව්‍ය මය සහ මූල්‍යමය වශයෙන් කොටින් පෝෂණය කරමින් දසදහස් ගණනක් අප ජනතාව

4 වන පිටුව බලන්න →

නැවතුණ කොවුල් හඬ එරබදු තොර බැද්ද
පැවතුණ විසි වසර පිපිරුම් වෙඩි සද්ද
වැනසුණ රට හදා යළි නිමකර යුද්ද
සැනසුම රැගෙන එයි සිංහළ අවු රුද්ද

Songs of lark and woods in bloom the April always had
All ceased in hellish gun-fire, years were extremely bad
A broken country now bouncing back from wretched war
This New Year brings the solace we have been longing for

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

## අද ලංකාවිත්ති පුවත්පත 12 වන වියට පා තබයි
## Today is Lanka Viththi newspaper's 12th Anniversary

ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට
සාමය සතුට පිරි,
සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3